රාජ්‍ය පරිපාලන චක්‍රලේඛ : 07/2023

මගේ අංකය : EST-3/POLIC/04/0064
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය
නිදහස් චතුරශ්‍රය
කොළඹ 07.

2023.05.08

අමාත්‍යාංශ ලේකම්වරුන්
පළාත් ප්‍රධාන ලේකම්වරුන්
දෙපාර්තමේන්තු ප්‍රධානීන්
රාජ්‍ය සංස්ථා, ව්‍යවස්ථාපිත මණ්ඩල ප්‍රධානීන්

**<u>2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දුන් දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සඳහා සහන ලබා දීම</u>**

2023 පළාත් පාලන ඡන්ද විමසීම සඳහා නාම යෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සම්බන්ධයෙන් පහත පරිදි කටයුතු කිරීමට 2023.05.02 දින පැවති අමාත්‍ය මණ්ඩල රැස්වීමේ දී තීරණය කර ඇත.

02. 2023 පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් සඳහා අපේක්ෂකයන් ලෙස නාම යෝජනා භාර දී ඇති දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නිරත නිලධාරීන්ට, ඔවුන් අපේක්ෂකයන් ලෙස ඉදිරිපත් වී ඇති පළාත් පාලන බල ප්‍රදේශය තුළ පිහිටි රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතනවල සේවයේ නිරත වී සිටින්නේ නම්, නැවත සේවයට වාර්තා කිරීමට හැකි වන පරිදි අදාළ පළාත් පාලන බල ප්‍රදේශ සීමාවෙන් බාහිර බල ප්‍රදේශයක පිහිටි රාජ්‍ය/ අර්ධ රාජ්‍ය ආයතන වෙත ස්ථාන මාරු කර සේවයට වාර්තා කිරීම සඳහා අවස්ථාව සලසා දීමට අදාළ බලධරයන් විසින් ක්‍රියා කළ යුතු ය.

03. ඒ අනුව, ආයතන සංග්‍රහයේ XXXII වැනි පරිච්ඡේදයේ 2:3:2 උප වගන්තියේ විධිවිධාන අනුව 2023 පළාත් පාලන ඡන්ද විමසීමට නාම යෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි රාජ්‍ය නිලධරයන් සහ නාම යෝජනා භාර දෙන ලද දේශපාලන අයිතිවාසිකම් හිමි අර්ධ රාජ්‍ය නිලධරයන් 2023.05.09 දින සිට අදාළ ආයතන ප්‍රධානීන් විසින් නම් කරනු ලබන සේවා ස්ථානයක් වෙත සේවයට වාර්තා කළ යුතු ය.

04. මෙම චක්‍රලේඛය මැතිවරණ කොමිෂන් සභාවේ ද එකඟත්වය ඇතිව නිකුත් කෙරේ.

කේ.ඩී.එන්. රංජිත් අසෝක
ලේකම්
රාජ්‍ය පරිපාලන, ස්වදේශ කටයුතු,
පළාත් සභා හා පළාත් පාලන අමාත්‍යාංශය

දුරකථන : 0112-696478
ෆැක්ස් : 0112-692158
විද්‍යුත් ලිපිනය : ade-iii@pubad.gov.lk